# කාම උන්මාදය සමනය කරගැනීම සඳහා ජාතක කථාවන්හි උපයෝගීතාව

ඕපනායක සුසීම හිමි[1]

මුල් බුදු සමයයට අනුව පුද්ගලයාට වැළඳෙන ප්‍රධාන රෝග වර්ග දෙකකි. ඒවා කායික රෝග සහ මානසික රෝග වශයෙනි. මේ රෝග වර්ග දෙක ම ඒවාට සාපේක්ෂ රෝග කාරක මත පදනම් වේ. මානසික රෝග විෂයයෙහි හේතු වන රෝග කාරක රාශියක් පිළිබඳ මූලික බුද්ධ දේශනාවන්හි සාකච්ඡාවට භාජනය වී ඇත. එකී විවිධ රෝගාබාධ හා ඒවාට තුඩු දෙන විවිධ රෝග කාරකයන් පිළිබඳ ගැඹුරු විචාරයක් ජාතක පාලිය ඇසුරින් නිමැවුණු ශ්‍රී ලාංකේය බෞද්ධ සාහිත්‍යාංගයක් වන ජාතක පොතෙහි අන්තර්ගත කථා පුවත් ඇසුරින් ඉස්මතු කොට ගත හැකි ය. නූතන මනෝවිද්‍යාවෙහි සාකච්ඡා වන මනෝරෝග රාශියක් දැකගත හැකි ය. ආතතිය, විශාදය, කාංශාව, භින්න උන්මාදය ඉන් සමහරකි. ජාතක පොතේ එන දරිමුඛ ජාතකය උන්මාද නමින් හඳුන්වන සුවිශේෂී මානසික රෝගී තත්ත්වය පිළිබඳ පුළුල් වර්ගීකරණයක් ඉදිරිපත් කරන ජාතක කථාවක් වශයෙන් හඳුනාගත හැකි ය. එහි විස්තර වන උන්මාදය නමින් හඳුන්වන විශේෂ මානසික රෝගී තත්ත්වයේ එක් අවස්ථාවකි කාම උන්මාදය. මෙය නූතන මනෝවිද්‍යාවෙහි Sexual Disorders නමින් හඳුන්වන අංශය හා යම් සමීප බවක් පෙන්නුම් කළ ද ලිංගිකත්වය පිළිබඳ විකෘති මානසිකත්වයේ විවිධ පැතිකඩ එමඟින් විද්‍යමාන වන බව හඳුනාගත හැකි ය. ඊට අමතර ව ජාතක පොතේ එන අන්දභූත, අසාතමන්ත, කච්ඡප, ලෝල, දූලුසී ආදි ජාතක කථාවල ද විකෘති ලිංගික ක්‍රියා හා ඒවාට තුඩු දෙන විවිධ විකෘති මානසික තත්ත්ව පිළිබඳ සාකච්ඡා කෙරේ. ලිංගිකත්වය පිළිබඳ ඇති වන මානසික ස්වභාවයන් විසින් පුද්ගල මානසික සෞඛ්‍යට මෙන් ම කායික සෞඛ්‍යයට ද ප්‍රබල බලපෑම් ඇති කරනු ලබයි. එය පුද්ගලාභ්‍යන්තරික විකෘතිතාවන්ට සෘජු ව ම බලපායි. එබඳු පුද්ගලයන්ගෙන් සමාජ යහපැවැත්මට ද එල්ල වන්නේ ප්‍රබල බලපෑමකි. ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ඝාතන, දේපළ හානි වැනි විවිධාකාරයේ සෘණාත්මක අංශ මේ කාම උන්මාදය නැමැති මානසික තත්ත්වය හේතුවෙන් වර්ධනය වේ. උක්ත විකෘති මානසික තත්ත්වයන් පිළිබඳ වාර්තාකථනයක් පමණක් නො ව නූතන සමාජයේ ප්‍රබල සමාජ ගැටලුවක් බවට පත් ව ඇති ලිංගිකත්වය පිළිබඳ විෂමාචාර සමනය කරගැනීම සඳහා මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමවේද රාශියක් ද ජාතක කථා ඇසුරින් හඳුනාගත හැකි ය. ඒ අනුව මේ පර්යේෂණයේ මූලික අරමුණ බවට පත් වන්නේ කාම උන්මාදය නමින් හඳුන්වන විකෘති ලිංගික මානසිකත්වය පිළිබඳ සැබෑ ස්වරූපය හුවා දැක්වීම හා එය සමනය කරගැනීම සඳහා ජාතක කථා මඟින් සැපයෙන උපයෝගීතාව අධ්‍යයනය කිරීම යි.

**ප්‍රමුඛ පදඃ** කාම උන්මාදය, ජාතක කථා, මනෝවිද්‍යාව, සමනය, මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර

---

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය